

ශ්‍රී ලංකා කලා මණ්ඩලය
ත්‍රෛමාසික

# කලා සඟරාව

இலங்கைக் கலைச் சபை
காலாண்டு

# கலைச் சஞ்சிகை

ARTS COUNCIL OF SRI LANKA
QUARTERLY

# KALA MAGAZINE

ජූනි
ஜூன
June

1998

49 { වන කලාපය
வது இதழ்
Volume

1998 { ජූනි
ஜூன்
June

# ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ
# කලා සඟරාව

**සංස්කාරකවරු:**

ආචාර්ය ඇස්. ජී. සමරසිංහ
මහින්ද රළපනාව
ඩී. එම්. ගුණරත්න
රාජේන්ද්‍ර බණ්ඩාර

# இலங்கைக் கலைச் சபை
# கலைச் சஞ்சிகை

**ஆசிரியர்கள்**

கலாநிதி எஸ். ஜீ. சமரசிங்ஹ
திரு. மஹிந்த ரலபஞுவ
திரு. டீ. எம். குணரத்ன
திரு. ராஜேந்த்ர பண்டார

# Arts Council of Sri Lanka
# Kala Magazine

**Editors**

Dr. S.G. Samarasinghe
Mahinda Ralapanawe
D.M. Gunaratna
Rajendra Bandara

## ශ්‍රී ලංකා කලා මණ්ඩලය

කේ. ජයතිලක (සභාපති)
ආචාර්ය පූජ්‍ය මාපලගම විපුලසාර නායක ස්වාමීන් වහන්සේ (උප සභාපති)
ආචාර්ය ඇස්. ජී. සමරසිංහ
මහින්ද රැළපනාව
අරුන්දති ශ්‍රී රංගනාදන්
රාජේන්ද්‍ර බණ්ඩාර (ලේකම්)

## இலங்கைக் கலைச் சபை

திரு. கே. ஜயதிலக (தலைவர்)
கலாநிதி மாபலகம விபுலசார நாயக்க தேரோ (உப தலைவர்)
கலாநிதி எஸ். ஜீ. சமரசிங்ஹ
மஹிந்த ரலபனுவ
அருந்ததி ஸ்ரீ ரங்கநாதன்
ராஜேந்த்ர பண்டார (செயலாளர்)

## Arts Council of Sri Lanka

K. Jayatilake - (President)
Ven. Dr. Mapalagama Vipulasara Nayaka Thero (Vice-President)
Dr. S. G. Samarasinghe
Mahinda Ralapanawe
Arundhathi Sri Renganathan
Rajendra Bandara (Secretary)

පිටකවරය : හර්ෂදේවගේ "රත්නාවලී" සංස්කෘත නාටකය සඳහා ලලිතා සරච්චන්ද්‍ර විසින් කළ නව නිෂ්පාදනයේ විජය නන්දසිරි හා රසාදරී පීරිස් රඟන දර්ශනයක්.

அட்டைப் படம்: அன்மையில் லலிதா சரத்சந்த்ரவினால் தயாரிக்கப்பட்ட "ரத்னாவளி" சமஸ்கிரத நாடகத்திலிருந்து விஜய நந்தசிரியும் ரசாதரி பீரிஸும் தோன்றும் காட்சி.

**Cover Page:** Vijaya Nandasiri and Rasadhari Pieris in action in a scene from recent production of Sanskrit Drama " Ratnavali" produced by Lalitha Sarathchandra.

# කතුවැකිය

*සංස්කෘතිය හා 21 වන ශතවර්ෂය කරා ආගමනය*

නිදහසේ ස්වර්ණ ජයන්තිය සැමරුමේ දී අපි අපගේ ප්‍රෞඪ සංස්කෘතික උරුමය කෙරෙහි අවධානය යොමු කළෙමු.

සංස්කෘතිය හා උරුමය වනාහි නිශ්චිතවම වෙනස් අස්තිත්වයන් දෙකකි. සංස්කෘතිය අවසන් වන්නේ හා උරුමය ආරම්භ වන්නේ කොතනද? උරුමය වනාහි ජාතික වශයෙන් අපගේ මුතුන්-මිත්තන්ගෙන් අපට ආවේණික වූ ඒවා වේති. සංස්කෘතිය වනාහි හැමවිටම වෙනස් වන්නා වූ ජාතියක අලුත් අදහස් සිතුම්-පැතුම් අභිලාෂයන් හා පරමාර්ථයන්ගේ මුසුවකි. ශ්‍රී ලංකාවේ සංස්කෘතියේ සංකීර්ණ විවිධත්වය සංස්කෘතිය යන අස්තිත්වයේ ක්‍රියාශීලී ස්වරූපයට කදිම නිදසුනකි. ඉතිහාසය තුළ අපගේ සංස්කෘතිය ස්ථිතිකව තිබුණේ නම් අපගේ සංස්කෘතියේ විවිධ යුගවල දක්නට ඇති නිශ්චිත ආකල්ප දක්නට හැකි නොවුනු ඇත. අනුරාධපුරය, පොලොන්නරුව හා මහනුවර යුගවල දක්නට ඇති.විවිධ ගෘහ නිර්මාණ හා කලා ශිල්ප විධි මීට නිදසුන් ය. ප්‍රබල විදේශීය ආක්‍රමණවල බලපෑම්වලට ලක්ව සංකීර්ණව ඇති අපගේ වර්තමාන සංස්කෘතිය ඉහත කී අවධිවල සංස්කෘතියට වඩා කෙතරම් වෙනස්ද යන්න පිළිබඳව අවධාරණය කළ යුතු ය. ජනතාවගේ සිතුම් - පැතුම් සමග සංස්කෘතියක් 'ඉදිරියට' ගමන් නොකරන්නේ නම් එවන් විටෙක එය සංස්කෘතියක් නොවන තත්වයට පත්වනු ලබයි.

අද සමහරු සංස්කෘතිය ප්‍රගමනයේ හා සුහදතාවයේ වර්ධනයට හා උනන්දුකාරකයක් කර ගැනීම වෙනුවට බාධකයක් කර ගනිති. 21 වන දශකයට අපි ආගමනය කරන විට, ලෝකය වඩාත් ලංවීමට යන්න දරණ විට, විශ්ව ගම්මානයක් බවට ලෝකය පත් වෙමින් තිබෙන විට අප ඉතිහාසයට ගැතිව සිටිමුද? නැතිනම් අපගේ ප්‍රබල සංස්කෘතිය සමග ඉදිරියට යමුද? යන්න නිශ්චිතව තීරණයක් අප ගත යුතුය.

විවිධ ආගම් සම්ප්‍රදාය හා විශ්වාස යන ප්‍රවාහයන්ගෙන් පරිපෝෂණය වනු ලබන ගංගාවක් ලෙස සංස්කෘතිය සැලකිය හැකිය. අපගේ සමාජය වැනි බහු ජාතික සමාජයක් තුළ විවිධත්වයෙන් පරිපෝෂණය වන සංස්කෘතියක් පහසුවෙන් හවුලේ එක්ව භුක්තිවිඳිය හැකිය. ශ්‍රී ලාංකික ජාතියක් වශයෙන් සහභාගීත්ව හැඳුනුමක් සඳහා පෙරමග එබඳු සංස්කෘතියක් ජනිත කළ හැකිය. දැනට ශ්‍රී ලංකාවේ පවත්නා ජාතිවාදී අර්බුදයට ස්ථිරසාර විසඳුම එයවනු ඇත. එම නිසා 21 වන ශත වර්ෂය කරා අපි ආගමනය කරන විට අපගේ සංස්කෘතිය උද්දීප්තවූත් ජාතික සහභාගීත්වයෙන් යුතු එකක් බවට පත්කර ගැනීමට කැප විය යුතුය.

# கலாசாரமும் புதிய ஆயிரமாண்டை நோக்கிய பயணமும்

50 அம் ஆண்டு சுதந்திர விழாவினைக் கொண்டாடும்போது பெருமைப்படக்கூடிய எமது கலாசார பூர்வீகத்தை வற்புறுத்துவதில் கவனஞ் செலுத்தினோம்.

கலாசாரமும் பூர்வீகமும் இரு வேறுபட்ட பகுதிகளாகும், கலாசாரமும் பூர்வீகமும் எங்கு ஆரம்பிக்கின்றன? பின்னையது ஒருதேசம் என்ற முறையில் நமது மூதாதையரிடமிருந்து பெறப்பட்டவை. முன்னையது ஒரு தேசத்தின் மாறிக்கொண்டே இருக்கும், போக்குகள், எதிர்பார்ப்புகள், இலட்சியங்களின் கலவையாகும். இலங்கையரின், எதிர்பார்ப்புளை கலவையாகும், இலங்கையரின் கலாசாரத்திலுள்ள நுணுக்கமான வேறுபாடுகள் கலாசாரம், எனக்கூறப்படும் பிரிவின் இயற்கையாற்றல் தன்மைக்கு உதாரணமாகும், எமது சரித்திர காலம முழுவதும் கலாசாரம் குத்திட்ட நிலையில் இருப்பின் ஒவ்வொரு காலப்பகுதியிலும் ஏற்பட்ட விசேடமான போக்குகளை நாம் ஒருபோதும் கண்டிருக்க முடியாது. உ-ம், அநுராதபுர, பொலநறுவை, கண்டி, காலங்களிலுள்ள வேறுபட்ட கட்டிட, கலை வடிவங்கள் மீண்டும், எமது தற்கால கலாசாரம் மேற்கூறிய காலப்பகுதிகளிலிருந்து அந்நிய படையெடுப்புகளின் தாக்கங்களினால் எவ்வளவு மாறுபட்டுள்ளன என்பதைக் கவனிப்போம். கலாசாரம் மக்களின் எண்ணக் கருவூலங்களுக்கேற்ப திரிந்து மாற்றமடையாவிட்டால் கலாசாரமாக இருக்கமுடியாது,

பலர் இன்று கலாசாரத்தை மாற்றத்தை ஏற்படுத்தும் கருவியாகக் கருதாது முன்னேற்றத்தையும் இணக்கத்தையும் ஏற்படுத்துவதற்குத் தடையாக கலாசாரத்தை ஆக்க முனைகின்றனர், புதிய ஆயிரமாண்டை அண்மித்து, உலகம் மிகவும் நெருங்கி பூகோள கிராமமாக வரும் வேளையில் நாம் நமது சரித்திரத்துடன் கட்டுண்டு இருக்கப்போகிறோமா அல்லது இயற்கையாற்றல் வாய்ந்த நமது கலாசாரத்துடன். முன்னேறப் போகிறோமா என்பதை தீர்மானிப்பது அவசியம்,

கலாசாரம் என்பது சமயங்கள், மரபுகள், நம்பிக்கைகள் என்ற பல அருவிகளினால் உருவாக்கப்படும் ஒரு நதி போன்றது, பல்லின மக்கள் வாழும் எமது சமூகத்தில் பல வேறுபாடுகளினால் வளமாக்கப்பட்ட கலாசாரம் ஒரு பொதுப் பிணைப்பாக இலகுவில் பங்கிடப்படக்கூடியது, இத்தகைய கலாசாரமே இலங்கையர் என்ற தேசிய ஒருமைப்பாட்டைப் பங்குகொள்ள வைக்கும் முதற் காலடியாகும், தற்போது இலங்கையில் நிலவும் இனக் கலவரத்திற்கு இது ஒன்றே நிலையான தீர்வாக அமையும். புதிய ஆயிரமாண்டை அணுகும் வேளையில் எமத கலாசாரத்தை துடிப்புள்ளதாக்கி எல்லோரும் பங்குகொள்ளவக்க அர்ப்பணிப்பான முயற்சி எடுப்போமாக.

# EDITORIAL

*Culture and our March to the New Millenium*

In celebrating the 50th Anniversary of Independence, we focssed our attention on proud Cultural Heritage.

Culture and Heritage are two distinct entities. Where does Culture end and Heritage begin? The latter is what we have inherited as a nation from our forefathers, the former is an ever-changing blend of the dominant attitudes, aspirations and ideals of a nation. The intricate diversities of the Sri Lankan Culture is in itself an example of the dynamic nature of the entity called Culture. For had our culture been static throughout our History, we would have never seen the distinct trends in each era of our history the different architectural and art forms of Anuradhapura, Polonnaruwa and Kandy areas. Again let us focus how divergent is our present Culture from that of those eras heavily influenced by foreign invasions. Culture ceases to be Culture if it does not move along with the thinking of the people.

Many people today tend to make Culture a barrier to progress and harmony, instead of a catalyst. At the threshold of the new millenium when the world is moving closer together, and becoming a Global Village, it is imperative that we make our choice - do we stay tied to history or do we forge ahead with our dynamic culture?

Culture is like a River that is fed with diverse channels of religions, traditions and beliefs. A Culture enriched by diversity can be easily shared as a common bond in a multi - ethnic society such as ours. Such a Culture is the stepping stone to a shared identity as a Sri Lankan nation, which in turn will be the only sustainable solution to ethnic strife presently prevailing in Sri Lanka. Let us make a dedicated effort to make our Culture a vibrant and shared one as we approach the new millenium.

# පටුන


| | | | පිටුව |
|---|---|---|---|
| 1. | පැරණි සිංහල කලා දෘෂ්ටිය හා වෙස්සන්තර සංකල්පය<br>ආචාර්ය පණ්ඩිත කේ. බී. ඒ. එඩ්මන්ඩ් | .............. | 5-11 |
| 2. | කලාව හඳුනාගැනීම<br>ගුණසේන විතාන | .............. | 12-15 |
| 3. | ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රය තුළ විද්‍යාමාන විවිධ ප්‍රවණතා<br>පී. ඩබ්. ජයන්ත අරවින්ද | .............. | 16-18 |
| 4. | පන් කවි<br>නෝමන් සිරිපාල | .............. | 19 |
| 5. | கம்பனில் இயல், இசை, நாடகம்<br>இ. ஜெயராஜ் | .............. | 20-26 |
| 6. | **The Canon of Sri Lankan Literature in English**<br>E. A. G. Fonseka | .......... | 27-44 |
| 7. | **Western Music in the Post-Independence Period in Sri Lanka**<br>Prof. V. Basnayake | .......... | 45-47 |

# පැරණි සිංහල කලා දෘෂ්ටිය හා වෙස්සන්තර සංකල්පය


### ආචාර්ය පණ්ඩිත කේ. බී. ඒ. එඩ්මන්ඩ්


පැරණි සිංහල සාහිත්‍යය බොහෝ දුරට පරිපෝෂණය වූයේ ජාතක කථාවලින් බව ප්‍රකට කරුණකි. සිංහල සාහිත්‍යයේ ආරම්භයේ පටන් ම ජාතක කථා ඒ කෙරෙහි කළ බලපෑම් අතිමහත්ය. ජාතක කථාවන්ගේ ආරම්භය ඊටත් බොහෝ පැරණි අවධියකට දිව යයි. "දැනට තිබෙන ජනකථා සංග්‍රහයන්ගෙන් ඉතාම වැදගත් වූ ද ඉතාම පැරණි වූ ද සංග්‍රහ ජාතක කථා "යයි රිස් ඩේවිඩ් පඬිවරයා සලකයි.[1] එසේ පවසා ඇත්තේ ජාතක කථාවන්ගේ මූලය ඉන්දියානු සම්භාවයක් ඇති ජානකථා කෙරෙහි ආරෝපනය කිරීමෙනි. කෙසේ වුවද ජාතක කථා පරිපූර්ණ උත්තම කථා සංග්‍රහයක් බවට සකස් වී ගියේ ලක්දිවේදී බව සැලකිය යුත්තකි.

ජාතක කථා පිළිබඳ විචාරයක යෙදෙන මාර්ටින් වික්‍රමසිංහ සූරීහු "ඒවා සාමූහික වෘද්ධ ඥානයකින් සකස් වූ කථා සමූහයක් " සේ දක්වති. උගතුන් පරපුරකගේ අත්දැකීම් හා වැටහෙන නුවණ නැවතීමක් නොවී වැඩෙමින් මේ කථා තුළට පිවිස ගෙන ඇති බැවින් ඒවා වෘද්ධත්වයෙන් උසස් වන බවද වික්‍රමසිංහයේ තව දුරටත් පෙන්වා දෙති.[2]

ජාතක කථාවන්ගේ සාහිත්‍යමය හා සාමයික ගුණ මහත්වය අතිශයින් පෘථුල වූවකි. එසේ වන්නේ විවිධ විෂය ක්ෂේත්‍රයන් කෙරෙහි මේ ගුණ මහත්මය පැතිර පවත්නා බැවිනි. වර්තමාන පොදු ජනයා කෙසේ වෙතත් බොහෝ බුද්ධිමත්හු ද මෙබඳු කරුණු අරබයා විමසිලිමත් වීමට මැළිකමක් දක්වති. අධ්‍යාපනයෙන් හෝ ප්‍රකෘති ස්වභාවයෙන් හෝ අගැයීම - විචාරය පිළිබඳව පූර්වයෙන් ලබා ඇති පරිචය පූර්වාදර්ශ කොට කලාකෘති අගැයීමට පෙළැඹි ඇත්තෝද ස්වකීය ගතානුගතික මාර්ගයෙන් මඳක් ඉවත් වී නව්‍ය වූ යමක් දෘෂ්ටිපථයට ගෝචර කොට ගැන්මට අපොහොසත් වෙති. මේ නිසා ජාතක කථාවල යටැ කී ගුණ මහත්වයෙන් බිංදු මාත්‍රයක් තව ද විනිවිද දකිනු පිණිස වෙස්සන්තර ජාතකය නිදසුනක් සේ ගෙන පැරණි සිංහලයාගේ කලා දෘෂ්ටිය පිළිබඳ කරුණු කීපයක් සංක්ෂිප්ත ලෙස විග්‍රහ කැර දැක්වීම මේ ලිපියේ මුඛ්‍ය අරමුණ වන්නේය.

දැනට විද්‍යාමාන පැරණි ම වෙස්සන්තර ජාතක කථා කෘතිය වනුයේ ක්‍රි. ව. 5 වන ශත වර්ෂයේ බුද්ධඝෝෂ හිමියන් විසින් ජාතකට්ඨකථා සංග්‍රහයට එක්කරන ලද වෙස්සන්තර ජාතකයයි. මෙය ඊට පූර්වයෙහි සිංහලයෙන් පැවති අටුවාවක පාලි පරිවර්තනයක් බව විද්වත්හු පෙන්වා දෙති.[3]. මේ අනුව වෙස්සන්තර ජාතකය දේශීය ඌරුවට ගැළපෙන පරිසමාප්ත සාහිත්‍ය නිර්මාණයක් ලෙස ප්‍රතිනිර්මාණය වී ඇත්තේ ලාංකේය විද්වත් සාහිත්‍යධරයන් අතින් බව පිළිගත යුත්තකි.

සිංහල සාහිත්‍ය ආරම්භයේ සිට ඉතා මෑතක් වනතුරු ලාංකේය ජන සමාජයෙහි වෙස්සන්තර ජාතකයට ලැබුණේ ඉතා ඉහළ තැනෙකි. ක්‍රි: පූ. 3 වන

1. Buddhist India (BI) T.W. Rhus Davids, Susil Gupta (India) Ltd, (Indidan Edition) 1950; p 137
2. 'හොඳම ජාතක කථා එක බෞද්ධයකුගේ නොව බෞද්ධ භික්ෂූන් හා ගිහියන් පරපුරකගේ අත්දැකීම් ප්‍රතිභාවන් භාවනාවන් සමාධියක් පිළිබඹු කරන රචනා ලෙස සලකමි. උගතුන් පරපුරකගේ අත්දැක්මි හා වැටහෙන නුවණ නැවතීමෙන් නැතිව වැඩුණු බැවින් වෘද්ධයන් උසස් වෙයි" ' බණකථා සාහිත්‍ය, මාර්ටින් වික්‍රමසිංහ , ඕවුන්ට් යන්ත්‍රාලය කොළඹ 6 1956 , 11පිට
3. "This Commentary is a transslation in to pali of the commentary as handed down in Ceylon' That ealier commentary, Now lost was in the Signalese language throught, was in the Sinhalese languase except as regards the verses, which were in Pali,

සියවසේ භාරතයේ භාර්හුත් හා සාංචි ස්තූපවල නෙළා ඇති කැටයම් අතර, වෙස්සන්තර ජාතකයට අයත් කැටයම් ද දක්නට ලැබේ. [4] එකල මෙම කථා වස්තුව භාරතයේ ද අතිශයින් ජනප්‍රිය ව පැවති බවට එය කදිම නිදසුනකි.

දුටුගැමුණු නරපතියන් විසින් මහා සෑයෙහි ධාතුගර්භයෙහි සිත්තම් කරවන ලද ජාතක කථා චිත්‍ර [5] අතර වෙස්සන්තර ජාතකයට අදාළ චිත්‍ර ද සවිස්තරව ඇඳ තිබුණි. පාලි ජාතකට්ඨ කථාව සිංහලයට නැගුණු සිංහලයට පරිවර්තනය කිරීමට පූර්වයෙහි සිංහලයට නැගුණු කථා කිපය අතර වෙස්සන්තර ජාතක කථාවට ලැබෙන්නේ වෙසෙස් තැනකි. පොළොන්නරු අවධියේ පිළියෙල වූ දස ජාතකයට වෙස්සන්තර ජාතක කථාව ද ඇතුළත් වෙයි. [6] මේ ජාතක කථාව නිසා බිහි වූ පරිවාර ග්‍රන්ථයක් සේ, වෙසතුරුදා සන්නය (ක්‍රි.ව. 1058 - 1153) දක්වා ලිය හැකිය. පාලි ජාතකට්ඨ කථාව සඳහා ලියූ ජාතක අටුවා නාට්‍යයෙහි වෙසතුරුදවට ලියවුණු ගැටපදයක් දක්නට නොවේ. පාලි තිබ් අපවත් වීනි ද නොඑසේ නම් වෙසතුරුදා සන්නය එම අඩුව සපුරා ලන හෙයින් අමුතු ගැටපදයක් නොලියන ලද්දේ දැයි ඉදුරා කිව නොහැකිය.

ගුරුළුගෝමීහු ද අමාවතුරෙහි ලා වෙස්සන්තර ජාතකය සිහිපත් කරවති.[7] විද්‍යාචක්‍රවර්තිහු බුත්සරණෙහි මෙන්ම දහම්සරණයේහිද වෙස්සන්තර ජාතකය සුන්දර සාහිත්‍ය නිර්මාණයක් සේ ඇතුළත් කරති. කුරුණෑගල සමයේදී සිංහල පන්සිය පනස් ජාතක පොතට උපුටා ගෙන ඇත්තේ බුත්සරණයෙහි එන වෙස්සන්තර ජාතක කථාවය . සෙන්කඩ ගල මධ්‍යතන අවධියෙහි වෙස්සන්තර ජාතකය අපූරු ගැමි කවක් බවට පත්විණ.

ක්‍රි. ව. 350 - 400 පමණ අවධියේ විසූහයි සැලකෙන ආර්යශූරපාදයෝ මේ කථාවස්තුව "විශ්වන්තර ජාතකය" යන නමින් ජාතක මාලාවට ඇතුළත් කළහ. ආර්යශූරපාදයන් එය ආරම්භ කොට ඇත්තේ " අල්ප පුද්ගලයන් බෝසත් සිරිත්හි පැවතිමට පමණක් නොව ඒවා වටහා ගැනීමට පවා අසීරු වන" බව පවසමිනි. [8]

පොදුවේ බලන කල බොහෝ දෙනෙකු වෙස්සන්තර ජාතකය දකින්නේ හුදු බණකථාවක් වශයෙන් පමණි. වැටහෙන නුවණ ඇති විචාරකයන් කිහිප දෙනෙකු විසින් එය බණකථාවකට පමණක් සීමා නුවූ ශ්‍රේෂ්ඨ ගණයේ සාහිත්‍ය නිර්මාණයක් සේ හඳුනා ගැනීමට ද වැරවැයම් කොට ඇත. වෙස්සනතර ජාතකය ප්‍රතිනිර්මාණය කිරීමෙන් පැරණි සිංහලයා ප්‍රකට කළ කලා දෘෂ්ටිය එයින් ද මුළුමනි ම හෙළි වී නැතැයි සිතමි.

වෙස්සන්තර ජාතකයේ උත්තමාර්ථයත්, පැරණි සිංහල කලා දෘෂ්ටියත් වටහා ගැනීමට, එය පැතිකඩ කිපයක් ඔස්සේ විමසිල්ලට ලක්කළ යුතුය. මෙහි යෙදී ඇති සංකේතාර්ථවත් පද පිළිබඳ අවධානය යෙදීම ද එහි ලා ඉතා වැදගත් වෙයි.

වෙස්සන්තර ජාතකය එනම් ගැන්වී ඇත්තේ, එහි ප්‍රධාන චරිතය වූ වෙස්සන්තර රජුගේ නමිනි. මේ පාලි 'වෙස්සන්තර' යන්නට ජාතකමාලා කතෘවර ආර්යශූරපාදයන් දී ඇත්තේ 'විශ්වන්තර' යන සංස්කෘත නාමයයි. බුත්සරණ කතුවරයා භාවිත කොට ඇත්තේද ඒ නාමය මැයි. මේ නාමය යෙදීම සම්බන්ධයෙන් ජාතක අටුවාව ඉදිරිපත් කොට ඇත්තේ "වෙස්සානං වීථියා මජ්ඣෙ" - යන වෙළෙඳුන්ගේ වේ මැදෙහි උපන් බැවින් වෙස්සන්තර විය යන අදහසයි. [9] මේ අර්ථකථනයෙහි සාවද්‍ය බවක් පෙනී යන්නේ එහි සංස්කෘත භාවයෙහි අර්ථය විග්‍රහ කර බලන විටය. පාලි 'වෙස්ස' යන්නෙහි අර්ථය වෙළඳ නම් එය සංස්කෘතියෙන් යෙදිය යුත්තේ 'වෛශ්‍ය' යනුවෙන් මිස 'විශ්ව' යනුවෙන් නොවේ.

4. BI. P. 138
5. මහාවංසො ෟ පරි89 ගා- ස්තූප වංශයෙහි මේ චිත්‍රවලින් පිළිඹිඹු වූ වෙස්සන්තර ජාතකයේ සිද්ධි මාලාව මැනවින් දක්වා ඇත.
6. ගෝඨය, මාගා ජනක, සාම, නිමි, ඛණ්ඩහාල, මහානාරද, ගුරිදත්ත, විධුර, උම්මග්ග සහ වෙස්සන්තර යන ජාතක දසජාතකයට ඇතුළත් වේ.
7. අමාවතුර, (සංස්,) පණ්ඩිත කෝද්‍රාගොඩ ඥානාලෝක හිමි ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 1958, 8, 29 සහ 44 පිටු
8. 'න බොධිසත්වචරිතං සුඛමනුමෝදිතුමපාල්ප සත්ත්වෙ ප්‍රාගෙවාචරිතුං' (ජාතකමාලා)
9. 'අට්ඨස්ස නාමගහණදිවසෙ වෙසසවීථියං ජාතකතා වෙස්සන්තරොති නාමං කරිංසු ජාතකට්ඨකථා - සයිමන් හේවාවිතාරණ ත්‍රිපිටක මුද්‍රණය vii භාගය, 1939 425 පිට

වෙස්සන්තර ජාතකයේ අරමුණු හා විෂයක්ෂේත්‍රය සලකන කල ආර්යශූර පාදයන් මෙන් බුත්සරණ කතුවරයා ද යෙදූ "විශ්වන්තර" යන නාමය වඩාත් යෝග්‍ය බව පෙනේ. "විශ්වන්තර" යන්නෙහි "විශ්වය සම්බන්ධ යුගය" "මුළු ලොවටම අයත්" "සියලු දෙනාට අදළ" වැනි අර්ථ ගැබ් වී ඇති බව පෙනී යයි. නියත වශයෙන්ම විශ්වන්තර ජාතකය විශ්වයට අදාළ සනාතනික කථා වස්තුවකි. (මෙහිලා "මන්වන්තර" (මනු+ අන්තර) යන පදයෙහි අර්ථ ද විග්‍රහ කර බැලීම ද ප්‍රයෝජනවත් විය හැකිය)

වෙස්සන්තර ජාතකයෙහි එන සෙසු නම්වලද ඇත්තේ සංකේතාත්මක ධ්වනියකි. සංජය (මුළුමනින්ම දිනීම) ඵුසති (දීය උල්පත - රසපැහැස්ම) මද්‍රී (සතුට ගෙනදීම) ජාලිය (දැල්සහිත - බැඳුම් හටගන්වන) කෘෂ්ණජිනා (කලු දේ හෙවත් නපුරු දෑ දිනීම) ජූජක (එළවා දමනු ලැබූ තැනැත්තා) අමිත්තතාපා (අහිතවන් වුවත් දවාලන) වැනි ජාතක කථාවෙහි පරමාර්ථවලට හා ජීවිත දර්ශනයට සම්බන්ධ කොට ගත් කල එයින් පෘථුලාර්ථ විවරණ මතු වෙයි. නිදසුනක් ලෙස ජාලිය නාමය දැක්විය හැකිය. වෙස්සන්තර රජුට බුද්ධත්වය ග්‍රහණය කර ගැනීමට දැලක් බවට පත්වන්නේ ජාලිය කුමාරයා. සඳ මහ රජු තම පුත්‍රයා නැවත යසසට පත් කරලීමට දැලක් සේ භාවිත කරන්නේ ජාලිය කුමරාගේ වයසීරටාවයි. ජාතක කථාවේ සන්දර්භය කෙරෙහි මේ නාමයන්ගේ සම්බන්ධය විවිධ පැතිවලින් සමායෝජනය වී පවතී.

මේ ජාතක කථාවේ දැක්වෙන වංගගිරිය ද අපූරු සංකේතයකි. කවර පුද්ගලයකුගේ වුවද ජීවිතයේ ඉතාම අර්බුදකාරී අවස්ථාව ඔහු වංගගිරියකට පිවිසීමක් වැන්න. ජීවිතයක කැපී පෙනෙන කුශලතාව වන්නේ ඒ වංගගිරියෙන් (Labyrinth) මුලා නොවී සිහි ඇති ව ඉන් පිටතට නික්මීමය. වෙසසන්තර ජාතකයෙන් මේ මානව පරමාර්ථය ඉතා සුන්දර ලෙස හෙළි පෙහෙළි කැරෙයි.

"පොකුරු වැස්ස" යන්න ද සංකේතාත්මක අගයෙන් යුතු වූවකි. පොකුරු වැස්සෙහි පතනය ධ්වනිත කරන්නේ ලෝවැස්සන්ගේ මානසික හා ශාරීරික පීඩා නැමැති දහය නිවාලීමයි. ඇලි ඇතු වර්ෂාවේ මෙන්ම සෞභාග්‍යයේ ද සංකේතයකි. පැරණි කලා දෘෂ්ටියේ එක් පැතිකඩක් හෙළි කරන මේ සංකේතවාදී අර්ථ සූචනය සාකච්ඡා කළ යුත්තේ නියත වශයෙන් ම වෙනම විෂය මාතෘකාවක් යටතේය. ඒවා මෙහි සඳහන් කරන ලද්දේ බෙහෙවින් සංක්ෂිප්තවය.

පැරණි කලාකරුවාගේ විශේෂයෙන් ම සාහිත්‍යකරුවාගේ දෘෂ්ටිය නූතන කලාකරුවාගේ හෝ සාහිත්‍යකරුවාගේ හෝ දෘෂ්ටියේ පාරමාර්ථික අංග අතින් වෙනස් ස්වරූපයක් ගන්නට පිළිවන. සමාජ පරිණාමය මේ වෙනස්කම් කෙරෙහි තදින් බලපා ඇති බව කිය යුතුය. ඉන් අනෙක් අතට කියැවෙන්නේ කවර කලා කෘතියක් වුවත් තත්කාලීන සමාජයේ මානසික වාතාවරණය මැනවින් පිළිබිඹු කරන බවයි. ඒ අනුව වෙස්සන්තර ජාතකයේ මුඛ්‍ය පරමාර්ථය වී ඇත්තේ, කවර හෝ සමාජයක යථා තත්ත්වය මනාව ප්‍රතිරූපණය කොට ඒ මගින් උත්තරීතර සමාජයක් ගොඩ නැගීම සඳහා ජනකාය පොළඹවා ලීමය.

පොදුවේ බලන කල පැරණි සිංහල ලේඛකයා ග්‍රන්ථකරණයෙහි යෙදුණේ පරමාර්ථ කීපයක් පෙරදැරි කර ගෙනය. පොදු ජනයාට ධර්මාවබෝධයද ජීවිතයේ යථා ස්වභාවයද පසක් කරදීම, බුදුන් වහන්සේ හා උන්වහන්සේගේ ධර්මය කෙරෙහි සැදැහැ බැති පෙම් වඩවාලීම, බෝධිසත්ව චරිතයෙහි උදාරත්වය හඳුන්වා දීම, සමාජ සුසංයෝජනය කෙරෙහි ජනකාය යොමු කරවනු පිණිස ඔවුන් පින්කිරියවකට පොළඹවා ලීම හා රස වින්දනය මගින් විනෝදාස්වාදයක් ලබා දීම යන කරුණු මෙහිලා ප්‍රධාන වෙයි.

වෙස්සන්තර ජාතකයෙහි ද අරමුණු අතර මේ සියල්ල ගොනු වී ඇති අතර, කලාවෙහි උපරිම බුද්ධිමත් ස්වභාවයද එයින් මොනවට ප්‍රකට කැරෙයි. දාන පාරමිතාවෙහි අනුසස් දක්වන මේ කථා වස්තුව නිතැතින්ම ශාන්ත රසයක් කරුණා රසයක් ගැප් වුවකි. උපතේ පටන් ම වාගාධිමානසික වූ වෙස්සන්තර රජ කලිඟු රටට වැසි පතා, එරටින් ආ බමුණු දූතයාට වැසි වස්සන බලයක් ඇති මහානුභාවසම්බන්න ඇලි ඇතු දන්දෙයි. ඇතු දන්දීම නිසා පුරවැස්සෝ වෙස්සන්තර රජුට කිපෙති. ඔවුන්ගේ උද්ගෝෂණයෙන් බේරීමට සඳ මහ රජ තෙම වෙස්සන්තර රජු තපස් රක්වනු පිණිස

වංකගිරියට පිටත් කර යවයි. රජ මෙහෙසිය මෙන්ම කුඩා දරුවෝ ද වෙස්සන්තර රජු සමග වංකගිරියට යෙති. එසේ යන විට එම රජ තෙමේ තමන් සතු දෑ දන් දෙයි.

වංක ගිරියෙදී තවුස්දම් පුරණ වෙස්සන්තර රජ තෙමේ වහලුන් සොයා පැමිණි ජූජක බමුණාට දරුවන් දන් දෙයි. අවසාන යේ රජ මෙහෙසිය- මද්‍රි දේවියද දන් දෙයි. දන් දෙන ලද රජ දෙබිගින්නෝ සඳ මහ රජු විසින් මුදා ගනු ලබයි. රාජකියයෝ යළි එක්-වෙති. රට යළිත් සෙමෙහි තැබෙයි.

වෙස්සන්තර සංකල්පය වටා ගොඩ නැගී ඇති මේ ජාතක කථාවෙන් සුවිශේෂ කොට දක්වනු ලබන කරුණු අතර, රාජ්‍ය පාලනය, පතිභක්තිය, දානවත, විපත් ජය ගැනීම, පුත්‍ර ස්නේහය, විවාහ සංස්ථාව, සමාජ සම්මතය යන කරුණු සුවිශේෂ තැනක් ගනියි. රාජ්‍යයක ප්‍රබලයාගේ පටන් දුබලයා දක්වා සමාජ සංස්ථාවක් එක්තරා ප්‍රමාණයකින් මේ කථා වස්තුවෙන් නිරූපණය කැරෙයි. මෙය කාලය හා දේශය විසින් සීමා නොකරනු ලැබූ කලා නිර්මාණයකි. සාහිත්‍ය නිර්මාණයකට වඩා මෙය කලා නිර්මාණයක් සේ සඳහන් කළ යුත්තේ මේ කථා වස්තුව ලෝකයේ බොහෝ රටවල පැතිර පවත්නා අතර, මීස වෙනත් කලා විෂයන් කෙරෙහිද බල පා ඇති බැවිනි. මෙබඳු කරුණු රාශියක් කේ .ජයතිලක මහතා විසින් රචිත "ජාතක සාහිත්‍ය හා වෙස්සන්තර " යන කෘතියෙහි සාකච්ඡා කොට ඇත. සාහිත්‍ය කෘතියක් වශයෙන් මෙහි පවත්නා දුර්වලතා කිපයක්ද ජයතිලක මහතා සාකච්ඡා කොට ඇතත්[10] ඒවා ඒ තරම් බරපතල දෝෂ සේ තැකිය යුතු නොවේ. මන්ද යත් දෝෂ පරිහාරය කෙරෙහි ලේඛකයා අවධානය යොදා නොමැති හෙයිනි.

වෙස්සන්තර ජාතකයේ සුවිශේෂත්වය අවබෝධ කර ගැනීමට එහි එන වැදගත් අවස්ථාවක් දෙකක් ගැඹුරින් විමසා බැලීම උචිතය. කවර සමාජයක වුවද එහි යහ පැවැත්ම සඳහා නීතිගරුක භාවය හා සාමය රැක ගැනීම අවශ්‍යය. මෙය අවිබලයෙන් හෝ වෙනත් බල පුළුවන්කාරකමකින් සිදු කොට ගත හැකකක් නොවේ. එසේ කළත් එය තාවකාලික වූවකි. යටෑ කී අයුරේ උසස් සමාජයක් පවත්වා ගැනීම සඳහා රටවැසියන් කෙරෙහි අධ්‍යාත්මික බලමහිමයක් ඇති කරවිය යුතුය. අධ්‍යාත්මික පාරිශුද්ධත්වය - තමාගේ පැවැත්මේ පවිත්‍රභාවය පිළිබඳ රජුගේ පටන් දිළින්දා දක්වා වූ සියලුම ජනකාය කිසියම් අවබෝධයකින් විසිය යුතුය. එය රජය හා මහජනයා අතර අන්‍යොන්‍ය දෘඪ බැඳීමට ද, සංස්කෘතියේ අඛණ්ඩ හා ශුභදායී වර්ධනයට ද මූල හේතු වෙයි.

අධ්‍යාපනයත් සංස්කෘතියත් පහත් මට්ටමක පවතින විට කවර රටක් වුවද කවර ජනසමාජයක් වුවද පිරිහේ. මෙහිලා අධ්‍යාපනය යනුවෙන් අදහස් කළේ නූතන අවධියේ මෙන් විෂය කේන්ද්‍රිය කොට ගත් ලාභම්ක වූ පටු අධ්‍යාපනයක් නොව අධ්‍යාත්ම විද්‍යාව ද ඇතුළු ආගමික දෘෂ්ටියෙන් ප්‍රභාවිත ජීවන දර්ශනය පිළිබඳ දැනුමය. පැරණි සිංහල කලා දෘෂ්ටිය ඉලක්ක කොට ඇත්තේ රසඥතාව මගින් ගැඹුරු ජීවන පරිඥානයක් ලබා දීමය. උසස් රසඥානය තුළින් කෙනෙකු ලබන ස්වයං ශික්ෂණය ඔහුගේ ඇතුළු හදින්ම මතුවන්නකි. අධ්‍යාපන මූලධර්මක්‍රම විද්‍යා හා අප්‍රමේය වූ දැනුම් සම්භාරයකින් ද හෙබි නූතන ලෝකයේ කවර සමාජයක වුවද මානව ශික්ෂණයක් දක්නට නොලැබෙනුයේ නූතන අධ්‍යාපනයෙන් අධ්‍යාත්මය පවිත්‍ර කරවන උත්තමාංගය ගිලිහී ගොස් ඇති බැවිනි. වෙස්සන්තර සංකල්පය මේ උත්තමාංගය පැරණි සිංහල සමාජයෙහි මනාව ක්‍රියාත්මක කොට ඇත.

අසීමිත බලමහිමයකින් යුතු රජකු ඒ බලතල ස්වාර්ථය උදෙසා භාවිත නොකොට තමන් විසින් ආරක්ෂා කළ යුතු ප්‍රජාවගේ ශුභ සිද්ධිය උදෙසා පරිත්‍යාග කරන සැටි, ඒ නිසාම අනන්ත දුක්ඛ දෝමනස්සයන්ට භාජන වන සැටි, මේ ව්‍යසනයට තමන් පමණක් නොව තම මෙහෙසියද සුරතල් දරුපැටවුන් ද බිලි දෙන සැටි සහෘදයා සිහි කරන්නේ කම්පිත හෘදයෙනි. ප්‍රජාව සත්‍යය වටහා ගෙන පසුතැවෙන තුරු රජතෙම තම බලය පාමින් ඉස්මතු වීමට උත්සාහ නොකරයි. වසර දහස් ගණනක් මුළුල්ලේ පෙරදිග බොහෝ රටවල ජනයාගේ නෙත් තෙත් කළ අන්‍ය සාහිත්‍ය කෘතියක් වෙස්සන්තර ජාතකය හැරෙන්නට නැතුවා නිසැකය.

10. ජාතක සාහිත්‍ය හා වෙස්සන්තර. කේ. ජයතිලක, ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ 12. 1988, 34 - 45 පිටු.

තෘෂ්ණාව පවත්නා තාක් කල් සත්ත්වයා මෝහයේ ගැලී දුකෙහි වෙළී කල් යවයි. ශාන්තිය ඇත්තේ තෘෂ්ණාව පහ වූ තැනය. ඇලීම දුරු වූ තැනය. ලෝක ස්වභාවය අවබෝධ කොට ගෙන සියලු ආසා නැසූ තැනය. යථාභූත ඥානයෙන් 'මමය මගේය' යන හැඟීම ඉවත් කළ තැනය. සියලු සැපසම්පත් ලබා ගත හැකි, ලෝකය කෙරෙහි බලපෑම් කළ හැකි තැනැත්තෙකු ඒ සියල්ල මෙරමාගේ සුව සඳහා අත් හැර දැමීම කෙබඳු නම් අසිරියක්ද? මේ චරිතය ආස්වාද කරන්නෝද නිතැතින් ම ස්වකීය චර්යාව වෙස්සන්තර සංකල්පයෙන් ප්‍රභාවිත ලොව කරා නිරන්තරයෙන්ම යොමු කරන්නාහ.

" හදයං චක්ඛුම්පහං දජ්ජා කිං මෙ බාහිරකං ධනං
හිරඤ්ඤං වා සුවණ්ණං වා මුත්තා වෙළුරියා මණී
දක්ඛිණං වාපහං බාහුං දිස්වා යාචකමාගතෙ
දදෙය්‍යං න විකම්පෙය්‍යං - දානෙ මෙ රමතී මනො [11]

(ඇස් ද හදවතද දුනිමි. මට බාහිර වූ කවර ධනයක්ද? රන් රුවන් මුතු මැණික් ආදී වූ කවර දෙයක්ද? දෙන්නැයි යාචක ජනයා අත දිගු කොට එනු දැක මම දන්දෙමි. කම්පාවට පත් නොවෙමි. මගේ සිත දානය කෙරෙහිම ඇලෙයි.)

යනු සඳහම්නි, වෙස්සන්තර ජාතක කතුවරයා දාන වීර, දයා වීර, ශාන්ත වීර, වෙස්සන්තර රජුගේ උත්තමාධ්‍යාසය තුළ ගන්වන්නේ.

වෙස්සන්තර රජුගේ දාන ව්‍යාපාරය වූකලී මෙරමා සුවපත් කරනු පිණිස කළ අව්‍යාජ කැපවීමකි. මෙය රටක උසස් සංස්කෘතියක් කෙරෙහි කෙසේ බලපාන්නේද? සංස්කෘතිය යන්නෙන් අදහස් කැරෙන්නේ යමකුගේ හද තුළ වූ අන්තර්ගත වේගයන්ට සාධු සම්මත අයුරින් සංවර්ධනය වීමට අවස්ථාව ලබා දීමයි. අතිබලවත් මහා ධනවත් රජතුමා පවා අපිස් ගුණයෙන් යුතුය පුරවැසියන්ගේ ඉල්ලීමට ඉඩ දී රජය අතහැර තවුස්දම් පිරීමට වලට යෑම සාමාන්‍ය මිනිසාගේ සිතෙහි හට ගන්වන්නේ විස්මයකි. ඒ ගුණ මහත්වය ගේ ආගන්තුරිකව අනුගමනය කිරීමට යන්න දුරයි. රාමායනයෙහි එන සීතාවගේ චරිතය මේ දක්වාම භාරතීය කාන්තාවන්ගේ චරිතය හැඩගැස් වූ පරිදි වෙස්සන්තර චරිතය සිංහල සමාජ චරිතය ද මනාව හැඩ ගැස්විය. ලක්දිව සාහිත්‍යකලාදිය පිරිහී ගිය සෙංකඩගල අවධියේ පවා උත්තම ගැමි කාව්‍යයන් බිහිකිරීමට තරම් වෙස්සන්තර සංකල්පය සිංහල කවියා මෙහෙයවාලූයේ එය එතෙක් සිංහල සමාජය කෙරෙහි වූ අතිමහත් ප්‍රභාව නිසාය.

යහපත් රජයක් මෙන් ම හොඳ ආර්ථික දියුණුවක් ද ඇති කල්හි පවා කවර රටක වුවද ශාන්තියක් සුභ සිද්ධියක් ඇති වෙතැයි කිව නොහැක. ඒ සඳහා උසස් සංස්කෘතියක් පැවතිය යුතු වේ. උසස් සංස්කෘතිය යනු විශ්ව මානව අභිවෘද්ධිය සඳහා වන පාරමාර්ථික ආකල්ප හා උසස් රුචිකත්වයක් සහිත සංස්කෘතියකි. වෙස්සන්තර සංකල්පය කාලාන්තරයක් තිස්සේ සිංහල සමාජය ඒ සඳහා මෙහෙය වූ සැටි විමර්ශනය කරන මානව විද්‍යාත්මක අවබෝධයක්ද ඇති විචාරකයකුට ජාතක සංග්‍රහයේ එන මේ ජාතකයට පමණක් කෙතරම් භාස්කමක් කළ හැකිදැයි අනුමානයෙන් හෝ සිතා ගනු බැරි නොවේ.

වෙස්සන්තර සංකල්පය පෙන්වා දෙන්නේ පැරනි සිංහලයා කලාවෙහි සෞන්දර්ය ගුණ දුටුවේ එහි අධ්‍යාත්මික හා ලෝකෝත්තර ගුණ මෙනෙහි කිරීමෙන් බවය. සාහිත්‍යයික පරමාර්ථ ඉක්ම වූ සාමයික දර්ශනික ප්‍රභාවක් එහි ගැබ් වී පවත්නේ ඒ හේතුවෙනි. ශ්‍රේෂ්ඨ කලා රීති බිහි කළ භරතමුනි, රජානක, කුන්තක, ආනන්ද වර්ධන ආදීන්ගේ මත ඔස්සේ විමංශනයට ලක් කළ විට පවා මණ්ඩනය වනු විනා ඛණ්ඩනය නොවන කලාත්මක සාහිත්‍ය නිර්මාණයකි, වෙස්සන්තර ජාතක කථාව. මේ කථා වස්තුවේ ගැඹුරු සංකල්පය හඳුනා ගැනීමට මවිසින් මතු කැරෙන නිපුණ භාව ප්‍රකාශනය හඳුනා ගත යුතුය. කලාව පිළිබඳ නියම සෞන්දර්යයීය වෙස්සන්තර සංකල්පයේ රැඳී පවත්නා බව එවිට හෙළි වනු ඇත.

11. ජාතකපාලි, 5244 ගා - මේ අදහස ජාතක මාලාකරුවෝ දක්වති. පාලි ජාතකයෙහි මෙන් ජාතකමාලාවේ විශ්වන්තර ජාතකයෙහි විස්තර බහුලයක් නැති අතර, එම කථාවස්තුවෙන් වැඩි පුර අවධාරණය කොට ඇත්තේ දාන ක්‍රියාවක් පමණි.

ජීවිත පරිඥානයෙන් යුතු වූවනට බෞද්ධ දර්ශනයේ ප්‍රභාව ඔස්සේ වෙස්සන්තර සංකල්පයේ පවත්නා චෛතසික ආස්වාදය හඳුනා ගැනීම දුෂ්කර නොවේ. භාරතීය සෞන්දර්ය විඥාන ශාස්ත්‍රයෙහි සුන්දරත්වය වැඩි වශයෙන් දකින්නේ වස්තුව දෙස බලන විමංශකයාගේ ආස්වාදය ප්‍රමාණයෙන් මිස වස්තුවෙහි ඒ ඒ මූල ගුණ (එනම් චිත්‍රයක නම් රේඛා වර්ණ ආදිය, සාහිත්‍ය කෘතියක නම් පදාර්ථ, අලංකාර ආදිය) පිළිබඳ ප්‍රාචාරකරණයෙන් නොවේ.

තාක්ෂණය එසේ නැතහොත් විද්‍යා විසින් මිනිසාට කරනු ලබනු මහ අපරාධය නම් භාව විරේචනයකට ඔහුට ඉඩ නොතැබීමයි. බණ මඩුවේ හිඳ රෑ මුළුල්ලේ ජාතක බණ කථා අසන ගැමියෙකුට තරම් ජීවිතය පිළිබඳ යථාවබෝධයක් නූතන හුන පෝෂිත පුද්ගලයකු විෂයෙහි දක්නට නොලැබෙනනේ ඔවුන්ගේ දැනුම අධ්‍යාත්මය කෙරෙහි නොව බාහිර හා භෞතික වස්තු කෙරෙහි පතුරුවා ලන බැවිනි. විද්‍යාව කිසිදාක රටක සංස්කෘතිය රැකීමට හෝ වර්ධනය කිරීමට නොහැක්කේද මේ හේතුව නිසාය. "වණික් ක්‍රමය හා උරෙනුර ගැමුණු අසාධුත්වයේ වර්ධනය කලාවන්ට "[12] මෙන්ම සංස්කෘතියට විහාග කරයි. වෙස්සන්තර සංකල්පය වැන්නකින් නූතන සමාජයට ගැඹුරු ආස්වාදයක් ලැබිය නොහැක්කේ තාක්ෂණය විසින් එය සංකීර්ණ මය වූ භාවමය අවුලකට ඇද දමා ඇති බැවිනි. නූතන තාක්ෂණයට මිනිසාගේ සැපවත් ජීවිතයට අවශ්‍ය ආහාර පානාදිය - යානවාහනාදිය හා ගේ දොර ආදිය සපයා දිය හැකිය. එහෙත් සැපවත් ජීවිතයක් සඳහා අධ්‍යාත්මය පවිත්‍ර කර ගැනීමෙහි ලා මිනිසා සකස් කරලීමට එයට පිළිවන් කමක් නැත. මේ භයානක දුර්වලතා අකාමකා ගැනීමට කලාත්මක නිර්මාණ මගින් ඇති කර ගත යුතු ධ්‍යානශීලතාව සඳහා වෙස්සන්තර සංකල්පය වැන්නක් උපයෝග කොට ගැනීමට නූතන සාහිත්‍යධරයන් හෝ අධ්‍යාපන විශේෂඥයන් හෝ පෙළැඹී නොයාම අභාග්‍යයකි.

සමාජ සංවර්ධනය සඳහා යෝග්‍ය සංස්කෘතියක් ගොඩ නැගීමේදී වෙස්සන්තර සංකල්පය වැනි කලා නිර්මාණ දෙයාකාරයකින් පරිශීලනය කළ හැකිය. එකක් නම් එය පැරණි දෘෂ්ටි කෝණ ඔස්සේ මෙන්ම නවදෘෂ්ටිකෝණ ඔස්සේ ද ගැඹුරින් අධ්‍යයන කොට ආස්වාදනය කිරීමයි. දෙවැන්න ඒ සංකල්පය අනුසාරයෙන් කාලීන වශයෙන් සමාජානුයෝග කොට ගත හැකි නව නිර්මාණ බිහි කිරීමයි. නිදසුන් ලෙස මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් ජාතක කථා කිහිපයක් ඇසුරින් නිර්මාණය කළ නාට්‍ය හා නවකථා (විලාසිනියකගේ ප්‍රේමය වැනි) දැක්විය හැකිය.

නූතන තාක්ෂණය නිසා අභිනවයෙන් බිහි වී ඇති පටු පුද්ගල සීමාව ඉවත් කොට උසස් රුචිකත්වයක් කෙරෙන් ගැඹුරු ආස්වාදනීය ප්‍රතිලාභයක් ඇති කිරීම උදෙසා සාහිත්‍යමය දෘෂ්ටි කෝණයකින් පමණක් වෙස්සන්තර සංකල්පය විමසීමට ප්‍රමාණවත් නොවේ. බොහෝ විචාරකයෙක් විසින් වෙස්සනතර ජාතකයෙහි හා ඒ ඇසුරින් බිහි වූ කෘතිවල සාකච්ඡාවකට භාජන කොට තිබේ. එබැවින් මේ ලිපියෙහි ලා එබඳු ව්‍යායාමයක් අපේක්ෂා කොට නැත.

"සාහිත්‍යය වූ කලී හුදෙක් රමණීයත්වය ඇති කරලන්නාවූද, ආස්වාදය ගෙන දෙන්නා වූද නිර්මාණයක් නොව, සාධුත්වය සිද්ධ කර ලන්නා වූ සහ ඒ හේතුව නිසාම මිනිසාට හිතකර සුචරිතවාදී ව්‍යාපාරයක්" බව 'කලාව යනු කුමක්ද?' යන කෘතියෙහි අවධාරණය කැරෙයි.

මේ අනුව ටෝල්ස්ටෝයිද ආගමික විජානනයෙන් යුත් සුචරිතවාදී කලාව අගය කළ යුතු බව කිය යුතුය. වෙස්සන්තර සංකල්පයද මේ කලා පරමාර්ථයට අනුගත වෙයි. නූතන තාක්ෂණයෙන් ඔද්දල් වූ මනස් ඇතිව ආතුර වූ සහෘදයා-ප්‍රේක්ෂකයා පවා සුවපත් කිරීමේ බලය ආකර්ෂණීය අයුරින් වෙස්සන්තර ජාතකයේ රැඳී පවතී. චරිත නිර්මාණය පමණක් නොව, පරිසර වර්ණනාද හෙළි කරන්නේ ජගත් ප්‍රකෘතිය සමග මානවයාගේ ඇති සබඳතාව උසස් ජීවන රටාවක් උදෙසා අත්‍යාවශ්‍ය බවයි. රජ සැපත් හැර වනයේ වෙසෙද්දී වෙස්සන්තර රජ පවුලට තෘප්තියෙන් හා සංයමයෙන් ජීවත් වීමට මහෝපකාරී වූයේ සෞන්දර්යය ප්‍රකට කළ වංකගිරි මහ වනයයි. සසර දුක් නැති කළ රහතන් වහන්සේ පවා

12. ආනන්ද කේ. කුමාරස්වාමි මහතා විසින්, Mediaeval Sinhalese Art' නම් වූ ස්වකීය කෘතියෙහි පෙරවදනෙහි ලා (ix පිට) පළ කළ අදහසකි.

මෙබඳු ස්වභාව ධර්මයේ ප්‍රකෘති සෞන්දර්යයෙන් ආස්වාදයක් ලැබුහ. වෙස්සන්තර සංකල්පය තුළින් මතු වන කලා දර්ශනය ද්‍රාණාධ්‍යාසය හා එහි පරිචිතය නම් වූ වේදයිතය මගින් සිංහල සමාජය එතෙක් මෙතෙක් සුසංයෝග කිරීමට ගත් අපූරු වෑයමක් සේ නිරූපණය කළ යුත්තකි. එහි පැරණි කලා පරමාර්ථ අතරින් අපේක්ෂිත මහඟු ඵල ලෙස

* ආගමික විඥානය
* රාජ්‍යතාන්ත්‍රික න්‍යාය
* ජගත් සෞන්දර්යය
* සමාජ උදාරත්වය
* උත්තම පුරුෂාර්ථ සාධනය
* භාව හා බුද්ධි ප්‍රබෝධනය
* රසාස්වාදය

යන කරුණු ප්‍රධාන තැනක් ගනී. මේවා කලා පරමාර්ථ සේ දක්වන ලද්දේ මේ කරුණු විෂයෙහි වෙස්සන්තර සංකල්පය හා බැඳුණු රසඥතාව ගැටී ඇති හෙයිනි. වෙස්සන්තර සංකල්පයේ සාහිත්‍යමය අගය පමණක් විමසීම විවාහ මංගල්‍යයකදී මනාලියක් බැලීමට පමණක් යන ගමනක් වැන්න. ඒ සඳහා දෙපක්ෂයම තව බොහෝ දුර ගමන් කළ යුතුව ඇත.

වසර දෙදහසකට වැඩි කාලයක් මුළුල්ලේ සිංහල ජන සමාජයේ හෘදය ප්‍රකම්පනය කරවමින් රසඥතාව පෘථුල කළ බුද්ධිය විශද කළ වෙස්සන්තර සංකල්පය අරබයා, මහා කවි කාලිදාසයන්ගේ රඝුවංශයේ එන ශ්ලෝකයක අදහස මදක් වෙනස් කොට දක්වමින් මේ කෙටි ලිපිය නිම කිරීම උචිතය යි සිතමි.

"උගත් ශික්ෂිත සුධීහු මේ වෙස්සන්තර ජාතකයට නැවතත් සවන් දෙත් වා ! ගින්නෙහි ලූ කල රන්වල පිරිසිදු හෝ අපිරිසිදු හෝ ස්වභාවය විද්‍යාමාන වන්නාක් මෙන් ඔබ පියවර තැබිය යුතු මාර්ගයෙහි හොඳ නරක වටහා ගැනීමට ඉන් කදිම ඉඟියක් ලැබෙනු ඇත"



# කලාව හඳුනාගැනීම

**ගුණසේන විතාන**

ජ්. ඒ. සුරවීර විසින් සිංහලට නගන ලද ලියෝ තෝල්ස්තෝයිගේ What is Art - කලාව යනු කුමක් ද, සංඥාපනයෙහි අනුවාදයේ සටහනක් මෙසේ කියවෙයි. 'කලාව, කලාව සඳහා ය යන මතය දැඩි ලෙස ප්‍රතික්ෂේප කරන ඔහු (තෝල්ස්තෝයි) කලාව මිනිසාගේ යහපත උදෙසා උපයෝගි වන ප්‍රබල මාධ්‍යයක් බව අවධාරණය කරයි. ඔහුගේ මතය වනුයේ යම් පුද්ගලයකු (එනම් කලාකරුවා) තුළ ඇතිවන වේදිත අන්‍යයන්ට (එනම් පාඨක, ප්‍රේක්ෂක ආදි ජනයාට) ලබාගත හැකිවීම හෙවත් විඳ ගත හැකි වීම ප්‍රමාණවත් නොවන බවය. කලාවෙන් කෙරෙනුයේ වේදිත සම්ප්‍රේෂණයකි. එබැවින් කලාකරුවා විඳ ගත් වේදිත අනුන් තුළ ඇති කර ලීමේ විඥාපන ශක්තියක් කලා නිර්මාණ තුළ තුබුව මනාය. කලාවේ තවද එක් කාර්යයක් වෙයි. එනම් ආසාදනයයි. මෙය සිදුවන්නේ කලාව පරිහරණය කරන තැනැත්තා විසින් එය අවබෝධ කරගනු ලැබීමෙන් හෙවත් ග්‍රහණය කරනු ලැබීමෙන්ය.'

(කලාව යනු කුමක්ද? සංඥාපනය - පිටුව 8)

සුරවීර සිය සංඥාපනයෙහි කලාව පරිහරණය කරන තැනැත්තාගේ වගකීම මෙහි අවධාරණය කරන්නේ ඒ සම්බන්ධයෙන් **ස්වාත්මීකාරය** හඳුන්වමින් තෝල්ස්තෝයි කර ඇති පහත සඳහන් කියමන ද උපුටා දක්වමින්ය.

'මේ වේදිතය පිළිබඳ ප්‍රධාන ලක්ෂණයක් වෙයි. එනම්, නියම කලාත්මක වින්දනයක් ලබන තැනැත්තා එය නිර්මාණය කළ කලාකරුවා සමග කෙතරම් ස්වාත්මගත වන්නේ ද යත් එම කෘතිය අන්‍යයකුගේ නොව තමාගේම යයි ඔහුට හැඟියාමය. එම කෘතියෙන් පැවසෙනුයේ තමන් කලක පටන්ම පැවසීමට අදහස් කරගෙන සිටි දෙයකැයි ඔහුට හැගෙයි. සැබෑ කලාකෘතිය තමාත් කලාකරුවාත් අතර පවත්නා දුරස්ථ සහ එය ග්‍රහණය කරන අනෙක් සියළු දෙනා අතර පවත්නා දුරස්ථතාවයත් නැති කරයි. මේ ආකාරයෙන් අන්‍යයන් හා ස්වාත්මගතවීම හේතුකොට ගෙන එක් එක් පුද්ගලයා තුළ පවත්නා පුද්ගලභාවය දුරස්ථ වීමෙන් හා තනි වීමෙන් මිදීම වනාහි කලාව සතු මූලික ලක්ෂණය මෙන්ම මහා ආකර්ෂණීය ශක්තිය ද වෙයි. (කලාව යනු කුමක්ද? පිටුව 155)

'කලාව යනු කුමක්ද?' නමැති විචාරය පළ වී දීඝු කලකට පසු **හර්බට් රීඩ්** (Herbert Read) නමැති කලා විචාරකයා **'කලාවේ තේරුම කුමක්ද?'** (The Meaning of Art) නමින් පොතක් පළ කළේය. රීඩ් ඉතාමත් සරලවත් ශුද්දෙක් සෞන්දර්යවාදියෙකු ලෙසත් කරන ලද මෙම විමර්ශනය එතරම් විවාදයකට ලක් නොවී, කලාකරුවන් සහ කලාරසිකයන් අතර ඉතාමත් ජනප්‍රිය විය. මෙම කලා විචාර දෙක අතර තුලනාත්මක අගයකට වඩා දක්නට ඇත්තේ වෙනස් අනුහුතින් දෙකකි.

ඇත්ත වශයෙන්ම හර්බට් රීඩ් කලා විචාර පිළිබඳ වියතෙකු වුවත් ඔහු තෝල්ස්තෝයි මෙන් සමාජයේ සෑම ස්ථරයකම සංවාදශීලීව ගැවසුණු කෙනෙක් නොවේ. තෝල්ස්තෝයි, සාර් පාලනය පැවැති රුසියානු සමාජය ප්‍රජාතන්ත්‍රික ලෙස වෙනස් කළ යුතු බව හරයේ කියා සිටි, සාර් පෙලපත්වලට සම්බන්ධ කවුන්ට් වරයෙක් විය. තෝල්ස්තෝයි සාර්වරුන්ගේ කලාවත් නැතහොත් වරප්‍රසාද ලත් කොටස්වල කලාවත් ආරක්ෂා කිරීමට කතා කළේ නැත. **කලාව කලාව සඳහා ය** යි කියමින් එද රුසියානු සමාජයේ විසු 'පිළිගත්' විචාරකයන් නිහඬ කරවීම සඳහා තෝල්සතොයි සගරාවක කොටස් වශයෙන් පළ කළ 'කලාව යනු කුමක්ද?' ඒ ආකාරයෙන්ම පළ කිරීමට සාර්ගේ වාරණ නීති ඉඩ දුන්නේ නැත.

එහෙත් පසු කාලයේ 'කලාව යනු කුමක්ද?' ලිපි සංග්‍රහය සම්පූර්ණයෙන්ම ඉංග්‍රීසියෙන් පළ කිරීමට කතුවරයා සමත්විය. තෝල්ස්තොයි 'කලාව යනු කුමක්ද?' කෘතියේ ඉංගිරිසි පරිවර්තනය සඳහා ලියූ සිය පෙරවදන මෙසේ ආරම්භ කළේය.

'මාගේ මෙම කලාව යනු කුමක්ද?' යන පොත දැන් පළමු වරට එහි නියම ස්වරූපයෙන් පළ වේ. මේ වන විට මෙහි මුද්‍රණ කිහිපයක් රුසියාවේදී පළ වී ඇත්තේ ය. මගේ කෘතියේ ඒ එක් එක් මුද්‍රණය පොත් අනුමත කරන්නවුන් අතින් කොතරම් විකෘති වූයේද යත් කලාව පිළිබඳව මගේ අදහස් දැනගනු රිසියවුන් මේ ඉංගිරිසි පරිවර්තනය පරිශීලනය කර නිගමනවලට එළඹෙන ලෙස මම ආයාචනා කරමි. මේ පොත මගේ නමද සහිතව විකෘති ස්වරූපයෙන් පළ කිරීමට හේතු වූ කරුණු මතු දැක්වෙන පරිදි පැහැදිලි කරමි.

'මගේ පිළිගැනීම අනුව, අධම, බුද්ධිහීන ආයතනයක් වන, අනුමත කිරීමේ මණ්ඩලය වෙත මාගේ ලිපි ලේඛන ඉදිරිපත් නොකිරීමට මම බොහෝ කලක සිට තීරණය කරගෙන සිටියෙමි.'

(කලාව යනු කුමක්ද? - පිටුව 23)

දහඅට දහඅට වන සියවස්වල සිට උසස් සාහිත්‍ය කලාංග බිහි කළ රුසියානු සමාජය එසේ මෝරන්නට වූයේ සමාජය තුළ හටගත් විප්ලවවාදී - ප්‍රජාතන්ත්‍රික පරිවර්තන ප්‍රවනතාවය නිසයි. රුසියානු සමාජයේ බහුජනතාව වූ ගොවි කම්කරු කොටස් අතරින් පන්ති සටන්කාමය මෝරන්නට වූ අවස්ථාවේ රුසියාවේ ඇතැම් රදල කොටස් ද එයට හරස් නොවී නිහඬව සිටීම උපක්‍රමයක් කර ගත්හ. **ලෙනින්** විසින් පවා පසුකාලයේ '**රුසියානු විප්ලවයේ කැඩපත**' වශයෙන් හඳුන්වන ලද තොල්ස්තොයි ද එක් හඬින් පිළිගැනීමට එද සාර් විරෝධී කලාකරුවෝ පවා පසුබෑහ.

**"කලාව කලාව සඳහා නොව, කලාව ජනතාව සඳහාය"** යනුවෙන් හඬ නැගූ ප්‍රබල ප්‍රජාතන්ත්‍රිය විචාරකයෙකු වූ **පිසාරෙව්** (Pisarev) ආදීහු ද එද තෝල්ස්තොයි සාර් වෙනුවෙන් හෙට්යු කතා කරන්නෙකු මෙන් සැලකූහ.

**සම්භාව්‍ය** රුසියානු විචාරකයෙකු සහ සමාජ විද්‍යාඥයෙකු වූ **ජී. ප්ලෙඛනොව්** (G. Plekhanov) 1899 වසරේ රුසියානු බසින් නිකුත් වූ **නචාලෝ** (ආරම්භය) නමැති සඟරාවේ අංක 4 කලාපයෙහි තෝල්සතොයිගේ 'කලාව යනු කුමක්ද?' ඉතා නිවැරදි ලෙස විමර්ශනයට ලක් කළේය.

කලාව පිළිබඳව තෝලස්තොයි, අසහාය ලේඛකයෙකු වශයෙන් යථාර්ථවාදීව ඉදිරිපත් කරන ලද කරුණු ප්ලෙඛනොව් අගය කළේය. එහෙත් ඔහු ඇතැම් අවස්ථාවලදී තෝල්ස්තොයි විවේචනයටද ලක් කළේය. රුසියානු පාලනයේ 'සැර බාලකර' විවේචනය කිරීම ගැන තෝල්ස්තොයිට චෝදනා එල්ල විය. කලාව පොදු ජනයාගේ උරුමයක් බව ප්‍රායෝගිකව සනාථ කිරීමට තෝල්ස්තොයි සහභාගීවී නැතැයි ද ප්ලෙඛනොව් කිය.

තෝල්ස්තොයිගේ 'කලාව යනු කුමක්ද?' රුසියාව ඇතුළත ප්‍රගතිශීලී, ප්‍රජාතන්ත්‍රවාදී ඇතැම් කොටස්වල විවේචනයට ලක්වූයේ දැඩි වාරන රීති යටතේ ඔහුගේ ලිපිවල අදහස් විකෘති කර තිබුණ නිසා විය හැකිය. තෝල්ස්තොයි ඉංග්‍රීසි පරිවර්තනය - සංස්කරණයෙහිද ඒ බව සඳහන් කළේය.

පෙර අපර විසූ පැරණි කලා විචාරකයන් කලාව හඳුන්වාදීමට බොහෝ උත්සාහ දරා ඇතත්, ඔවුන්ගෙන් සංග්‍රහ වූයේ කලාංග සහ කලාකෘති මිස කලාව යනු කුමක්දැයි හඳුන්වන කිසිවක් නොවේ. **සෞන්දර්යය** (Aesthetic) සහ **අලංකාරය** (Beauty) හඳුන්වමින් පැරණි වියතුන් කලාව විචාර කර ඇතත් ඔවුන් කිසිවෙකුට සමාජ අධ්‍යයනික පදනමකින් කලාව හඳුනා ගැනීමට පහසු වී නොමැත.

තෝල්ස්තොයි රුසියානු සමාජ විප්ලවය ගැඹුරින් දැක එම සමාජයේ අධ්‍යාත්මය පැහැදිලිව හඳුනාගත් බව පසු කාලයේ ලෙනින් ද සඳහන් කළේය.

මිනිස් ඉතිහාසයේ ඉතාමත් වැදගත් සමාජ විප්ලවය වූයේ "1917 **ඔක්තෝබර් විප්ලවය**" යි. එය පසුකාලයේ සමස්ත සමාජයේම චින්තාව ප්‍රවර්ධනය කිරීමට ඉදින් බලපෑවේය. ලෝකයේ එක් කොටසක වැඩ කරන පන්ති රාජ්‍යයක් බිහිවීමත් එහි ආශ්වාදයෙන් ලොව පුරා යටත් විජිත විරෝධී, අධිරාජ්‍ය විරෝධී සහ ධනපති විරෝධී ප්‍රබල ප්‍රවනතාවයක් ඇතිවීමත් සුවිශේෂ හේතුසාධක වෙයි. 1934 **මැක්සිම් ගෝර්කි** 'කලාව යනු කුමක්ද?'

යන්නට අලුත් අරුතක් දෙමින් **සමාජවාදී යථාර්ථවාදී රීතිය** (Socialist Realism) ඉදිරිපත් කළේය.

ලොව පවතින්නේ බහුපාන්තික සමාජ ක්‍රමයක් බවත් එබැවින් වරප්‍රසාද ලත් සහ වරප්‍රසාද නොලත් වශයෙන් සමාජය බෙදී යන බවත් යුරෝපීය සමාජ චින්තකයින් වූ **හේගල්, මාක්ස්, එංගල්ස්** ආදීන් විසින් විද්‍යාත්මක ලෙස ලොව අවධාරණය කර තිබුණි. 'කලාව කා සඳහා ද?' යන ප්‍රශ්නය නගන ලද්දේ ද මෙම ප්‍රවනතාවය විසිනි.

'**ඔක්තෝබර් විප්ලවය**' ජයග්‍රහණය කරවීමට එද **මෙයර්හෝල්ඩ්,** (Meyerhold), **අයිසෙන්ටීන්** (Eisentein), **මායකොව්ස්කි** (Mayakousky) ආදී රුසියානු කලාකරුවෝ ඉදිරිපත් වූහ. නිග්‍රෝ ජනකලාශ්‍රිත චිත්‍ර කලාවක් ලොවට හඳුන්වා දී යුරෝපයේ ධනකුවේරයින්ට එවැනි කලාකෘති අලෙවි කළ **පිකාසෝ** කලාව, සමාජයේ බහුජනතාවට සේවය කළ යුතු බව පිළිගත්තේය. යුද්ධයට විරුද්ධව ඔහු '**ගුවෙනිකා**' නිර්මාණය කළේය. සාමයට පක්ෂව අද ලොව පුරා දකින්නට ලැබෙන '**පරවි**' **සංකේතයද** පිකාසෝගේ නිර්මාණයකි.

කලාව යනු කුමක්ද? ඉංග්‍රීසි පරිවර්තනයෙහි තොල්ස්තොයිගේ එක් අර්ථකතනයක් පරිවර්තකයා විසින් සඳහන් කර ඇත්තේ The art of the upper Classes, උසස් පන්තියේ කලාව, වශයෙනි. කලාව යනු කුමක්ද? ඉංගිරිසි පරිවර්තනය නිකුත් වීමෙන් පසු තොල්ස්තොයි ඉංගිරිසි බසින් About what is Called Art නමින් එක්තරා පැහැදිලි කිරීමක් නැවත කළේය. එය ඔහුගේ මුල් කෘතිය තරම් ගැඹුරු විමර්ශනයක් වුයේ නැතත්, ඔහු එමගින් ඇතමුන්ගේ අදහස් විවේචනය කිරීමට උත්සාහ දරා ඇත.

කලාව හඳුනා ගැනීම අරබයා මෑත සියවස්වල යුරෝපීය විචාරකයන් අතරින් වැඩි පිරිසක් බිහිවූයේ **රුසියාව, ජර්මනිය** සහ **ප්‍රංශය** ආදී රටවලිනි. ඒ ආකාරයෙන් කලාව හඳුනා ගැනීමක් එකල ඉංග්‍රීසි කලා විචාරකයන්ට අවශ්‍යව තිබුණ බවක් නොපෙනුනි. යුරෝපීය කලාකරුවන් වූ **ගර්තෙ** (Goethe) **ෂිලර්** (Schiller) **මොසාට්** (Musset), **බීතෝවන්** (Beethoven), **රපායෙල්** (Raphael) , **වින්සි** (Vinci), ආදීහු එද සිය නිර්මාණකරණය කලාව කා සඳහා විය යුතුද යන අවධානය ඇතිව සංග්‍රහ කළහ.

සමාජයේ බහුජන කලාවක්, බහුජන සංස්කෘතියක් යන සංකල්පය මෙසේ සමාජ සංවාදයට එක්වූයේ වී නමුත් එයට හරස් වූ ප්‍රතිගාමී වූ සමාජ - දේශපාලන ප්‍රයත්නයක් ද විය.

'**කලාකරුවාගේ අසීමිත නිදහස**' මුවාවෙන් කලාවට වැටවල් බැඳීමේ ව්‍යාපාර ආරම්භ වූයේ කලාව යනු කුමක්දැයි ගැඹුරුව සංවාදවීම සමගය. කලාව සම්බන්ධ විවිධ 'අම්තුරු වාද', පවා බිහි විය. **අභිනව වාදය** (Modernism) එවැන්නක් වශයෙන් හැඳින්වීමට පුළුවන.

ඔක්තෝබර් විප්ලවයෙන් ගොඩනැගුණ සෝවියට් සංගමයත්, අනෙකුත් යුරෝපීය සමාජවාදී රාජ්‍යයනුත් ඇද වැටීමෙන් පසු සමාජවාදී කලා රීතිය වූ '**සමාජවාදී යථාර්ථවාදය**' අභාවිනව ඇත. සමාජවාදී රාජ්‍යක්‍රමයක් නොමැති විටෙක සමාජවාදී යථාර්ථයක් තිබිය නොහැකි බැවිනි. එහෙත් 'සමාජවාදය' යන්නෙන් කියවෙන 'සමාජයේ බහුතරයේ අයිතිය, සමාජයට අවනත වීමේ ශික්ෂණය, බහුතරයට හිස නැමීම ආදීහු සාමූහික නැතහොත් සාංඝික පැවැත්ම සාධාරණීයකරණය කළ හැක්කේ අරුත් සුන් කලාවකට නොවේ.

තොල්ස්තොයිලාටත් කලින් රුසියානු සාහිත්‍යය පෝෂණය කළ ලේඛකයන්ගෙන් දොස්තයෙව්ස්කි කෙනෙකි. Beauty will save the world **සුන්දරත්වය ලොව ආරක්ෂා කරනවා**' ඇතැයි යන විශ්වාසය ඇතිව එද ඔහු රුසියානු සෞන්දර්ය හඳුනාදීමට උත්සාහ කළේය. ඔහු ඉන් අදහස් කරන්නට ඇත්තේ දෑසට පෙනෙන අලංකාරය පමණක්ද? කලකට පෙර ලොව පුරා දැඩි අවධානයට ලක්ව තිබුණ **සමාජවාදී සෞන්දර්යවාදය** Socialist Aesthetics අනුව නම් Beauty - ලස්සන නැතහොත් සුන්දරත්වය ඇසට පෙනෙන දෙයක් පමණක් නොවේ. පසිඳුරන් විසින් තෘප්තියක් ලබන සෑම දෙයක් තුළම එකී සුන්දරත්වය පවතියි. කෙනෙකුගේ සිතෙහි හටගන්නා සුන්දර චින්තාවක් ඇතැම් විට ඔහුගේ කුසලතා වලින්ම චිත්‍රයක්, ගීතයක්, රිද්මයක් බවට පත් වෙයි. තොල්ස්තොයි කලාව හඳුනා ගැනීමට උත්සාහ කරන්නේ ද දොස්තයෙව්ස්කි මෙන්ම සමාජය ආශ්වාදවත් කිරීමේ

අරමුණෙනි. චීනයේ මූ ශුන්ගේ නිර්මාණ චීන සමාජයේ බහුතර දිළිඳු ජනතාවගේ සංතෘෂ්ඨිය සඳහා කැපවුයේද කලාව ඒ අයගේ සතුට සැපත සඳහා මෙහෙයවීමට තිබුණ වුවමනාව නිසා නොවේද?

ස්ටාලින්ගේ පාලන කාලයේ හන්ගේරියාවේ විසූ මාක්ස්වාදී විචාරකයෙකු වූ ජෝර්ජ් ලූකාකස් (George Lukacs සමාජවාදය තුළ කලාව යනු කුමක්දැයි විමර්ශනය කිරීමට මහත් උත්සාහයක් දැරුවේය. ඇතැම් අවස්ථාවල ඔහුට බර්ටොල් බෙෂ්ට්, ඇනා සෙගර්ස් Anna Seghers ආදී ජර්මන් මාක්ස්වාදී කලාකරුවන් සමග ද ගැටෙන්නට සිදුවිය. ලූකාක්ස්ගේ අවසන් සමයේ ඔහුගේ ප්‍රධාන ඉල්ලීම වූයේ සමාජවාදී රටක බහුතරයේ කලාව ගැඹුරින් හඳුනාගන්නා ලෙසයි. ඔහු පෙන්නාදුන් ආකාරයට සමාජවාදී රටවල් ජනතාවගේ කලාව හොඳින් හඳුනා ගැනීමට අපොහොසත් වීම නිසා ජනතාවට සමාජවාදී ආණ්ඩු එපා විය.

කලාව හඳුනා ගැනීමේදී අපේ අවධානය යොමු විය යුත්තේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක කලාව සඳහායි. අප ජීවත් වන සමාජය, වැඩවසම්, යටත් විජිත සමාජයක් නොව ප්‍රජාතන්ත්‍රික සංයමයන් සහ ශික්ෂණයෙන් ගොඩනැගෙන්නට උත්සාහ දරන සමාජයකි. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක කලාවද ප්‍රජාතන්ත්‍රික ගුණාංගයන්ගෙන් පෝෂිත වුවකි. එය වහලුන්ගේ, රජවරුන්ගේ, විජිතවාදීන්ගේ කලාවක්ද නොවේ. තෝල්ස්තොයි සිය කලා විචාරයෙහි අරමුණු කර ගන්නා ලද්දේද ද එවැනි කලාවකි.

යටත් විජිත ග්‍රහණයෙන් මිදී පනස් වසරක නිදහස් අනුභූතින් ඇති අප රටේ කලාව හඳුනා ගත හැකි විශේෂ ලක්ෂණ මොනවාද? වහල් කලාවකත්, නිදහස් කලාවකත් සෞන්දර්යාත්මක වෙනස හඳුනා ගන්නේ නැතිව අපට ප්‍රජාතන්ත්‍රවාදී කලාවක් ගොඩනැගීමට හැකි වන්නේ ද නැත. අපේ රටේ වසන විවිධ ජාතික, විවිධ ආගමික, විවිධ පන්තික සියලු ජන කොටස්වල අනන්‍යතා ගරු කරන දේශියව මුල් බැසගත් කලාවක් අපට අවශ්‍යව තිබේ. එය නියතයෙන්ම දෙවිවරුන් සහ බමුණන්ගේ කලාවක් නොව මිනිසුන්ගේ කලාවක් ම විය යුතුය.

වරක් පිකැසෝ සඳහන් කළාක් මෙන් ඇමරිකාව සහ අනෙකුත් යුරෝපීය රටවල පවතින්නේ ධනේශ්වර සමාජ ලක්ෂණ වලින් පෝෂිත නාම මාත්‍ර ප්‍රජාතන්ත්‍රවාදයකි. එම ප්‍රජාතන්ත්‍රය තුළ කම්හල් හිමියන් සහ බැංකු හිමියන්ට රජයක් පෙරලන්නට හෝ අලුතෙන් බිහි කරන්නට හෝ පුළුවන. අදත් ඇමරිකාවේ ජනාධිපතිවරයා පත් කළ හැකිව ඇත්තේ එරට වසන සල්ලිකාර යුදෙව්වන් කිහිප දෙනෙකුටය. එහෙත් අපේ ප්‍රජාතන්ත්‍රවාදය ඉංගිරිසින් විසින් පැරිවුටයකින් බස්වන ලද්දක් ද නොවේ. අනාදිමත් කාලයක් තිස්සේ අප සමාජයේ ජන සම්මතවාදී ශික්ෂණයක් පවත්වා ගෙන ආ උසස් සංස්කෘතියක් පවතියි. අපේ කලාව ගොඩනැගිය හැකි වන්නේ එම සංස්කෘතිකාංග පසක් කර ගත් දැක්මකට පමණකි.

## ආශ්‍රිත ග්‍රන්ථ


G. Plekhanov - Unaddressed Letters
Art and Social Life

Read Herbert - The Meaning of Art

ලියෝ තෝල්ස්තොයි - කලාව යනු කුමක්ද ?
ඒ. වී. සුරවීර පරිවර්තනය

Anna Seghers - DIE Hochzeit von Haiti

Yuri Pavydov - The October Revolution and the Arts.

Mike Pavidow - People's Theater From the Box Office to the Stage.

# ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රය තුළ විද්‍යාමාන විවිධ ප්‍රවණතා

පී. ඩබ්. ජයන්ත අරවින්ද

ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රය තුළ විද්‍යාමාන විවිධ ප්‍රවණතා විමසා බැලීමේ දී පසුගිය වකවානුව තුළ සංගීත කලාවේ ප්‍රගමනය හා එම අතීත ප්‍රවණතා පිළිබඳ විමසා බැලීම වැදගත් ය.

මට වසර දෙසිය පනහකට පමණ පෙර ආරම්භ වූ දක්ෂිණ භාරතීය බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස, මෙරට මුහුදු බඩ පළාත්වල පැතිර ගිය නාඩගම් සංගීතය මුල් කොට, මෙරට ප්‍රායෝගික වශයෙන් ව්‍යවහාරික (applied) සංගීත කලාවක් ව්‍යාප්ත විය. ඉන් අනතුරු ව, එනම් අදින් වසර එකසිය පනහකට පමණ පෙර සිට උත්තර භාරතීය සංගීත ය බලපෑම් තුළින් මෙරට පැතිරගිය නූර්ති සංගීතය හා එක් ව ගත් කල, මෙම ශෛලීන් දෙක ම කාලයක් තිස්සේ දේශීය පරිසරය තුළ භාවිතා වීම කරණ කොට ගෙන විදේශීය ස්වරූපය මැකී ගොස් අද දේශීය සම්ප්‍රදායන් බවට පත් ව ඇති 'ව්‍යවහාරික' සංගීත ශෛලීහු ය.

නූර්ති ගීතයක් සමග මෙරට ව්‍යාප්ත වූ 'ග්‍රැමෆෝන්' ගීතය මෙතෙක් පැවති ව්‍යවහාරික සංගීත ශෛලීන්ගෙන් බැහැර ව, සංගීත රසාස්වාදය අරමුණු කොට ගත් 'යථාරූපී' (pure music) සංගීතයක් කරා පිය නැගූ අවස්ථාව සනිටුහන් කරයි.

නවසිය හතළිස් ගණන්වල සිට මෙරට ගුවන් විදුලිය මඟින් 'සරල ගීත' රාශියක් ප්‍රචාරය වීමට ආරම්භ වීම වැදගත් සිදුවීමකි. මෙසේ ගුවන්විදුලිය තුළින් ජනප්‍රියත්වයට පත් සුනිල් ශාන්ත, පී. එල්. ඒ. සෝමපාල, සී. ටී. ප්‍රනාන්දු, ආනන්ද සමරකෝන්, ඇල්බට් පෙරේරා (දැන් අමරදේව), සුසිල් ප්‍රේමරත්න, ආර්. ඒ. චන්ද්‍රසේන ආදි ගායකයින් රාශියක් රසවත් සරල ගීතනු ස්වතන්ත්‍ර ලෙස නිර්මාණය කරමින් සංගීත රසිකයා පිනවූහ.

භාරතීය ගීතය ප්‍රධාන මූලාශ්‍ර කොට ගෙන පැවති සිංහල සංගීත ක්ෂේත්‍රය, ගුවන්විදුලිය මඟින් බහුල ලෙස ප්‍රචාරය වන්නට වූ හින්දි චිත්‍රපට ගීත තුළින් හා ඒ අනුසාරයෙන් බිහි වූ සිංහල චිත්‍රපට ගී තුළින් නවසිය හැට ගණන් පමණ දක්වා පෝෂණය විය.

භාරතීය ගී තනු අනුකරණයෙන් බැහැර ව ස්වතන්ත්‍ර ලෙස දේශීය ගී තනු නිර්මාණය කිරීමට බට ප්‍රථම පුද්ගලයා ආනන්ද සමරකෝන් විය යුතු ය. මොහු වංග සංගීතයේ ආභාසය ලබමින් සිංහල ගැමි පරිසරය මවන ගී පද මාලා සහිත අපූරු දේශීය ගී ආරක් බිහි කෙළේ ය.

